www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජර්මානු දේශපාලකයෝ සහ මාධ්‍ය මීලඟ ගෝලීය මූල්‍ය අර්බුදය ගැන අනතුරු අඟවති

## German politicians, media warn about the next global financial crisis

පීටර් ෂ්වාට්ස් විසිනි

2009 නොවැම්බර් 26

තීව්‍රතාවයෙන් හා කම්පනයෙන් 2008 හේමන්ත අර්බුදය අභිබවා යන දෙවන අන්තර්ජාතික මූල්‍ය කඩාවැටීමක් පිලිබඳ බිය ජර්මානු ප්‍රධාන දේශපාලන කවයන් තුල වැඩෙමින් පවතී.

සති අන්තයේදී චාන්සලර් ඇන්ජලා මර්කෙල් සහ මුදල් ඇමති වොල්ෆ්ගන්ග් ෂෝබ්ල් (දෙදෙනාම ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍ර සංගමයේ (සීඩීයූ) සාමාජිකයින්වේ) ආර්ථික අර්බුදයේ අවසානය තව දුර බවට අනතුරු ඇඟවූහ. "ජනතාව මත අර්බුදයේ බලපෑම සීමා කරන්නට අපට මුලදී හැකියාව ලැබුන නමුත්, බාධක අප ඉදිරියේ තවමත් පවතී." මර්කෙල් සීඩීයූ රැස්වීමකදී පැවසීය.

ෂෝබ්ල් වර්තමාන මූල්‍ය අර්බුදය වසර විස්සකට ඉහතදී බිඳ වැටුනු බර්ලින් තාප්පය සමග සංසන්දනය කලේය. "බර්ලින් තාප්පය ඇදවැටුනු ලෙසින්ම බලවත්ව මූල්‍ය අර්බුදය ලෝකය වෙනස් කරනු ඇත. ඇමරිකාව, ආසියාව සහ යුරෝපය අතර තුලනය නාටකාකාරව වෙනස්වෙමින් පවතී." ඔහු බිල්ඩ් ආම් සොන්ටැග් වෙත පැවසීය. තමන්ගේ බෝනස් ගෙවීම්වලදී පාලනයක් පවත්වාගන්නාමෙන් ඔහු බැංකුකරුවන්ට ආයාචනා කලේය.

බැංකු කඩාවැටීම් වල නව වටයක් එලඹේ නම්, සමාජ බිඳවැටීමක් ගැන යුරෝපා මහ බැංකුවේ අධිපති ෂෝන් ක්ලෝඩ් ට්‍රයිචෙට් බිය පලකලේය. "අර්බුදය අවසන් බව පැවසීමට ඇත්තටම කල්වේලා වැඩියි." ෆ්‍රැන්ක්ෆර්ට් හිදී බැංකුකරුවන්ගේ යුරෝපා කොන්ග්‍රසයක් අමතමින් එසේ පැවසූ ඔහු මෙසේ අනතුරු ඇඟවීමක්ද ඊට එකතු කලේය. "බදු ගෙවන්නන්ගේ මුදලින් මූල්‍ය අංශවලට එවැනි විශාල සහයෝගයක් දෙවතාවකදීම ලබාදීමට අපගේ ප්‍රජාතන්ත්‍රයන් ඉඩ දෙන එකක් නැහැ."

පසුගිය මාස අට පුරා වැඩුනු අති විශාල කොටස් වෙලඳපොල බුබුල තවත් කඩාවැටීමක අනතුර පෙන්නුම් කරන බරපතල සාධකය වේ. ඩව් ජෝන්ස්, ජපාන නික්කෙයි සහ ජර්මානු ඩැක්ස් වැනි වඩා වැදගත් කොටස් මිල දර්ශකයන් මාර්තුවේ සිට සියයට 50 - 60 කින් ඉහල ගොස් ඇත. බොර තෙල්, තඹ සහ අනෙකුත් අමු ද්‍රව්‍යයන්හි මිලද දෙගුනයක් වී ඇත. මෙම දැවැන්ත ඉහල යෑම් කිසිදු සමානුරූපී ආර්ථික වර්ධනයකට පදනම් නොවේ. ඊට ප්‍රතිවිරුද්ධව, බොහෝ රටවල ආර්ථික ක්‍රියාකාරකම් බිඳවැටී ඇති අතර බොහෝ සමාගම් තවමත් පාඩු වාර්තා කරමින් සිටිති.

කොටස් මිල ඉහලනැගීම ආන්ඩු සහ මහ බැංකු විසින් ආර්ථිකයට පොම්ප කල දැවැන්ත මුදල් සම්භාරය නිසා සිදු වූවකි. සැබැවින්ම සියයට බිංදුවේ පොලියට මහ බැංකුවලින් අසීමිත මුදල් කන්දරා නයට ගන්නට මූල්‍ය ආයතන වලට හැකිවන අතර ඒවා තමන්ගේ සමපේක්ෂ ගනුදෙනුවල යොදවා ඉහල ලාභ උපයති. ආර්ථිකය නැවත ගොඩගන්නට යොදවන බදුගෙවන්නන්ගේ ට්‍රිලියන ගනන් මුදල් ආයෝජන සඳහා නොයෙදවෙන නමුත්, සමපේක්ෂ ගනුදෙනුවලට ද, කොටස්ලාභීන්ට ඉහල ගෙවීම් සඳහා ද, බැංකුකරුවන්ගේ ඉතා අධික බෝනස් ගෙවීම් සඳහා ද යෙදවේ.

වර්තමාන කොටස් වෙලඳපොල නැගීම ගැන විශ්ලේෂනයක් කරන සතිපතා ජර්මානු ව්‍යාපාර සඟරාවක් වන "වර්ස්ෂාෆ්ට්වොෂෙ" මෙසේ ලියයි. " බොහෝ මුදල් කොහේ හෝ යා යුතු බැවිනුත් කොටස් මිල ආකර්ෂනීය වන නිසාත් කොටස් වෙලඳපොල ඉහල නගිමින් තිබේ." සඟරාවට අනුව, අදාල ආයතනයේ කොටසක වෙලඳපොල වටිනාකම, කොටසක වාර්ෂික ආදායමත් සමග සංසන්දනය කර බැලීමේදී, එනම් මිලට ආදායමේ අනුපාතය, 133 ක් වන ඓතිහාසික අගයකට ලඟා වී තිබේ. මිලට ආදායමේ අනුපාතය 14 ක් හෝ ඊට වැඩි නම් කොටස් ඉතා විශාල ලෙස මිල කර ඇති ලෙසට සැලකේ.

අර්බුදයේ ප්‍රතිපලයක් ලෙසට එක්සත් ජනපදයේ පමනක් සෑම මසකම දස දහස් ගනන් කම්කරුවන්ට රැකියාවල් අහිමිවීම් ද, වැටුප් අත්හරින්නට බලකිරීම් ද, දැවැන්ත පරිමානව සමාජ වැඩසටහන් කප්පාදු කිරීම් ද සිදුවේ. ඒ සමග ම සමාජයේ ඉහල තලයේ ධනවත් වීම අර්බුදයට කලින් පැවති මට්ටමට සමාන මට්ටමට හෝ ඊට ඉහල අගයකට ලඟාවී ඇත.

විශාල ආයෝජන බැංකු සහ හෙජ් අරමුදල් තමන්ගේ කාර්ය මන්ඩලයට මේ වසරේදී බෝනස් ලෙස ඩොලර් බිලියන 100 කට වැඩි මුදලක් ගෙවනු ඇත. එ.ජ. බැංකුවක් වන ගෝල්ඩ්මන් සැක්ස් මේ වෙනුවෙන් ඩොලර් බිලියන 17 ක් වෙන් කර තිබේ. ජර්මනියේ ඩැක්ස්හි ලැයිස්තුගත විශාල ව්‍යාපාර 30 ක් තම කොටස්හිමියන්ට යුරෝ බිලියන 20 කට වැඩි මුදලක් පවරන්නට සැලසුම් කර තිබේ. ඒ තම දල ලාභයෙන් සියයට 71 කි. මීට ඉහත වාර්තාගත වසර වන 2007 දී ඊට යෙදවූ අගය සියයට 45 ක් පමනි. නව ආයෝජන සඳහා අනොන්‍ය වශයෙන් අඩු ගනනක් වෙන් කර ඇත.

මර්කෙල්, ෂෝබ්ල් සහ ට්‍රයිචෙට්ගේ අනතුරු ඇඟවීම්වල පසුබිම මෙයයි. මූල්‍ය වෙලඳපොලෙහි නව අර්බුදය හා බැඳුනු මූල්‍ය කතිපයාධිකාරයේ ලැජ්ජා විරහිත ධනවත්වීම් පාලනය කල නොහෙන සමාජ කැරැල්ලක් මුදා හරිනු ඇතැයි ඔවුහු බිය වෙති.

තවත් මූල්‍ය කඩාවැටීමක් නොවැලැක්විය හැකි බව බොහෝ විශේෂඥයෝ විශ්වාස කරති. සතිපතා ප්‍රවෘත්ති සඟරාවක් වන ඩර් ස්පීගල්හි මේ සතියේ වෙලුමෙහි පලමු පිටුවෙහි හෙඩිම, විහිලු පොතක ආකාරයට හැඟීම් දනවන "ට්‍රිලියන බෝම්බය" නම් විය. පිටු 12 ක් පුරා ලියවුන එම ලිපියේ ආරම්භයෙන්ම අවධාරනය කරන්නේ, වර්තමාන කොටස් වෙලඳපොල බුබුල පුපුරා යයිද යන්න නොව එය කවදා සිදුවේවිද යන්නය.

ඊලඟට ලියවෙන්නේ ධනවාදී සමාජයේ වර්තමාන ස්වභාවයේ කඩාහැලෙන පින්තූරය ගැනයි. "ලෝක ආර්ථිකය තවමත් අර්බුදයෙන් ග්‍රස්තව පවතිද්දී මූල්‍යමය ප්‍රභූව නැවතත් බිලියන ගනන් ගොඩ ගසමින් සිටිති"යි ලිපිය පවසයි. "පැරනි කෑදරකම නැවතත් පැමින ඇති අතර පැරනි කුනු කන්දල් ද ඒ සමග ම ය." නූතන ආර්ථික ඉතිහාසයේ කවරදාකවත් සිදු නොවූ අන්දමට "මූල්‍ය කර්මාන්තයට රාජ්‍ය අරමුදල් වෙත අවහිරතාවකින් තොරව අතපෙවීමකට හැකියාව තිබුනි." අධිඋද්ධමනයේ අවදානම 1920 ගනන්වල ආරම්භයේදී ජර්මනිය අත්විඳි ලෙස අනතුරුදායකව සීඝ්‍රව ඉදිරියට ඇදෙන මූදල් බාල්දුවීමක්" ගැන ඩර් ස්පීගල් විශේෂයෙන්ම අනතුරු අගවයි.

ඒ සමග ම, බ්‍රිතාන්‍යයේ මූල්‍ය සේවා අධිකාරියේ සභාපති අඩෙයිර් ටර්නර් උපුටා දක්වමින්, අර්බුදයේ දෘෂ්ටිවාදාත්මක බලපෑම ගැන ලිපිය පෙන්වා දෙයි. එහි ඇතුලත් වී ඇත්තේ තනි තනි බැංකුවල අර්බුදයක් පමනක් නොව "බුද්ධිමය සිතුවිලි" වල ද අර්බුදයකි. "මිල ගනන් වැදගත් තොරතුරු ගෙනඑන අතර වෙලඳපොල තර්කානුකූලව හැසිරෙන බව සහ අතාර්කික අවස්ථාවල දී තමන්ව ම නිවැරදි කරගනී, යන්න අපගේ වැටහීමයි. මේ සියල්ල ප්‍රශ්න කල යුතු මට්ටමට පැමින ඇත." වෙනත් ආකාරයට පැවසුවහොත්, ධනවාදය සහ නිදහස් වෙලඳපොල ආර්ථිකය මුලුමනින්ම අපකීර්තියට පත්ව තිබේ.

ඩර් ස්පීගල් තමන්ගේ ප්‍රධාන චෝදිල්ල එ.ජ. ආන්ඩුවට එල්ල කරයි. "එ.ජ.යේ මූල්‍ය කර්මාන්තය මුදල් අමාත්‍යවරයා (භාන්ඩාගාර ලේකම්) විසින් නොව මූල්‍ය කර්මාන්තය විසින්ම පාලනය කෙරේ" යනුවෙන් අනුමැතියෙන් තොරව සටහන් තබන ලිපිය, ගෝල්ඩ්මන් සැක්ස් වැනි බැංකුවල විධායක කාර්යාලවල සිට භාන්ඩාගාර දෙපාර්තමේනතුවට හෝ ජනාධිපති බැරැක් ඔබාමාගේ සමීපයට යාමට සහ ආපසු ඒමට තම වෘත්තීය විස්තාරනය කරගන්නා බොහෝ පුද්ගලයන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කරයි.

"රුසියාව දෙස නෙත් යොමන විශ්ලේෂනීය සංසුන්කමට සමාන අයුරකින් යමෙක් එජ දෙස බලයි නම්, දේශපාලකයින්ගේ සහ බැංකුකරුවන්ගේ එකමුතුවකින් සමන්විත කතිපයාධිකාරී පාලනයක් ගැන කිසිවෙකුට කතා නොකර සිටිය නොහැක." ඇමෙරිකානු ආර්ථික විශේෂඥයෙක් වන ජේම්ස් ගල්බ්‍රයිත්ගේ නිරීක්ෂනයක් ලිපිය උපුටා දක්වයි. "අගමැති ව්ලැඩිමීර් පුටින්ගේ සහ රුසියාවේ අමු ද්‍රව්‍ය රාජධානිය පාලනය කරන ව්‍යාපාර බලවතුන්ගේ බැඳීමට වඩා අඩු නැති බැඳීමකින් වෝල්ස්ට්‍රීට්හි හා වොෂින්ටනයේ බලවත්තු සමීපව සිටිති."

රාජ්‍ය අනුග්‍රහය ලබන උද්ධමනකාරී වැඩපිලිවෙල සහ ලාබ මුදල් ප්‍රතිපත්තිය හැකි ඉක්මනින් අවසාන කරන්නට ද, ඒ වෙනුවට ව්‍යාපාර බදු පහල හෙලීම හා තියුනු අයවැය කපාහැරීම අවධාරනය කරන්නට ද, ජර්මානු පාලක ප්‍රභූවේ කොටසකට ඇති අවශ්‍යතාවය වෙනුවෙන් ඩර් ස්පීගල් පෙනීසිටී. මෙමගින් සමාජ වැසටහන්වල සැලකිය යුතු කඩාවැටීමක් සහ බංකොලොත්වීම් හා රැකියා කප්පාදුවල කෙටි කාලීන ඉහලයාමක් සිදුවුවත්, ගනනය කල නොහෙන සමාජ විපාක සමග සිදුවන හදිසි ආර්ථික කඩාවැටීමක් හා සසඳන විට මෙය අඩු නපුරක් ලෙස සැලකිය හැක.

ඩර් ස්පීගල්හි ආකල්පය බර්ලින් ආන්ඩුවේ ආකල්පය හා ඉඳුරාම සමානරූපී වේ. පිටවයන ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල සභාගය, සැප්තැම්බරයේ පාර්ලිමේන්තු මැතිවරනයට ටික කලකට පෙරාතුව, "නය තිරිංගයක්" ව්‍යවස්ථාගත කර ඇති බැවින් නව රජයට කර්කෂ පටි තද කර ගැනීමේ මාර්ගයකට යාමට දැන් බල කෙරේ. 2016 වනවිට නව රාජ්‍ය නය යුරෝ බිලියන 86 ක සිට බිලියන 10 කට අඩු කල යුතුය. නය තිරිංගය පාවිච්චි කිරීමට සහ යුරෝපා සංගමයේ ස්ථායිතා ගිවිසුමට අනුගතවීමට මුදල් ඇමති ෂෝබ්ල් නැවත නැවතත් අවධාරනය කරන අතර, එමගින් අලුත් නය, දල දේශීය නිෂ්පාදනයෙන් සියයට තුනකට සීමා කෙරේ.

එනමුදු බොහෝ ඇතුලත සහ පිටත දේශපාලන පීඩනයන් සැලකිල්ලට ගැනීමේදී මෙම කර්කෂ මාර්ගයට අවතීර්නවීම වසරකින් පමන පමාවිය හැක. මැතිවරනය අවසාන වීමත් සමග ම චාන්සලර් මර්කල් හට සමාජ සහනාධාර කප්පාදුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට සිදු වුවහොත්, සීඩියුවට ඇති සහයෝගය තවදුරටත් සෝදාපාලුවන අතර බුන්ඩස්රාට්හි (පාර්ලිමේන්තුවේ ඉහල මන්ත්‍රී මංඩලය) තම රජයට ඇති වැඩිඡන්ද ගනන අඩුවෙතැයි ඇය බියවී සිටී. ජාත්‍යන්තර තලයේදී, වොෂින්ටනය සහ ලන්ඩනය සමග මූල්‍ය ප්‍රතිපත්ති සම්බන්ධව තියුනු වෙනස්කම් පවතින අතර, ඒවා දැනටමත් පිට්ස්බර්ග්හි ජී-20 සමුලුවේදී එකිනෙකා අතර ගැටුම්වලට යොමු කර ඇත.

තම කර්මාන්ත පදනමෙහි විශාල කොටසක් මූල්‍ය අංශයට කැපකල එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය, සීමා පනවන ලද මූල්‍ය ප්‍රතිපත්තියක් කෙරේ ජර්මනියට වඩා අඩු සැලකිල්ලක් දක්වති. අපනයන වෙලඳම සහ කර්මාන්ත අතින් ලෝකයේ ප්‍රබලතමයන් අතර සිටින ජර්මනිය තම තරගකාරී ස්ථානයට දුර්වල ඩොලරයෙන් වන බලපෑම් ගැන බිය වී සිටී. ඇමෙරිකානු මූල්‍ය අංශය ගැන ඩර් ස්පීගල්හි ප්‍රහාරයේ සැරපරුෂභාවය, කලාතුරකින් විවෘතව සාකච්ඡා කරන අන්‍යොන්‍ය ආතතීන්ගේ උග්‍රභාවය ප්‍රකට කෙරේ.

මේ සියල්ල කම්කරු පන්තියට අනතුරු ඇඟවීමක් ලෙසට පෙනී යා යුතුය. සමාජ සහ දේශපාලන සමාදානය තව දුරටත් නොපවතින තරමට ධනවාදයේ ගෝලීය අර්බුදය ඉස්මත්තට පැමින ඇත. කම්කරුවන් බිහිසුනු සමාජ අරගලවලට සූදානම් විය යුතුය.

© www.wsws.org